**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**
**ලංසු කැඳවීම.**

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (වයඹ පළාත) සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් හා ලාබාංශ රහිතව) (රුපියල් මිලියන) | CIDA ශ්‍රේණිය | ලංසු ආරක්ෂණය (රුපියල්) | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර දින) |
|---|---|---|---|---|---|---|
| 1 | **RDA/SP/1500KM / NWP /06** | **කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කෝවාන උයන්දන මාර්ගය ඉදි කිරීම.** | **11.93** | **C6 සහ C5** | **191,500.00** | **දින 120** |
| 2 | **RDA/SP/1500KM / NWP /07** | **කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් දූනුපොත ගමමැද මාර්ගය ඉදි කිරීම.** | **11.71** | **C6 සහ C5** | **187,900.00** | **දින 120** |
| 3 | **RDA/SP/1500KM / NWP /08** | **කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කිරින්දව යායවත්ත මාර්ගය ඉදි කිරීම.** | **15.96** | **C6 සහ C5** | **256,400.00** | **දින 120** |
| 4 | **RDA/SP/1500KM / NWP /09** | **කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් පිටදෙණිය - හම්මලව - ගලගෙදර මාර්ගය ඉදි කිරීම.** | **15.42** | **C6 සහ C5** | **247,500.00** | **දින 120** |
| 5 | **RDA/SP/1500KM / NWP /10** | **කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් දනිකිතව හන්දියේ සිට වැටියෙගෙදර කෝන්ගස්දෙණිය (2 වන අදියර) මාර්ගය ඉදි කිරීම.** | **12.55** | **C6 සහ C5** | **201,500.00** | **දින 120** |

2. වැඩ විෂය : පාදම, ඇස්පෝල්ට් ඇතිරීම, කාණු කැපීම, මාර්ගයේ ඉරි සළකුණු කිරීම.

3. මෙම ප්‍රසම්පාදනය **ජාතික තරඟකාරී ලංසු තැබීම (NCB)** හරහා සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනය යටතේ (වැට් බදු හා අනෙකුත් බදු හැර) සිදු කිරීමට නියමිත වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50ට අඩු බැවින් රාජ්‍ය මුල්‍යා චක්‍රලේඛණයේ අංක 04/2026(III) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ.

4. **කොන්ත්‍රාත්** ප්‍රධානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් මහා මාර්ග විශේෂත්වය යටතේ ඉහත වගුවේ දක්වා ඇති පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ CIDA අදාළ ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

5. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.03.07** දින සිට පහත සඳහන් කාර්යාල වලින් ලංසු ලේඛන පරීක්ෂා කිරීම සිදුකල හැකි අතර **2024.03.07** වන දින සිට **2024.03.21** දක්වා 9.00 පැය සිට 15.00 පැය අතර කාලයේදී පහත සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි වේ.

- ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහ මැදුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
  දු.ක අංකය - **011-2884790**

- පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (වයඹ), මාර්ග සංවර්ධන අධිකාරිය,පුත්තලම් පාර, කුරුණෑගල
  දු.ක අංකය -**037-2056534**

6. **2024.03.14** වන දින පෙ.ව 10.00ට පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (වයඹ), මාර්ග සංවර්ධන අධිකාරිය,පුත්තලම් පාර, කුරුණෑගල දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

7. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (වයඹ), මාර්ග සංවර්ධන අධිකාරිය,පුත්තලම් පාර, කුරුණෑගල සහ ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහ මැදුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයන්ගෙන් ලංසු ලේඛන කාර්යාලීය වේලාව තුලදී කිසිඳු ගාස්තුවකින් තොරව පරීක්ෂා කිරීම කල හැකි අතර **2024.03.07** දින සිට **2024.03.21** දින දක්වා **9.00 පැය සිට 15.00** පැය කාලය තුල ආපසු නොගෙවනු ලබන **රු.4,130.00** ලේඛණ ගාස්තු ගෙවීම් කරන ලද (බදු සහිතව) රිසිට්පතද සමඟ ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් පළාත්භාර අධ්‍යක්ෂ (වයඹ) කාර්යාලය , මාර්ග සංවර්ධන අධිකාරිය,පුත්තලම් පාර, කුරුණෑගල සහ ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහ මැදුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල වෙතින් ලබා ගත හැකිය.

   1987 අංක 3 දරන පොදු පනත අනුව මිලියන 5ට වැඩි ලංසු සඳහා ලංසුකරුවන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහතිකය සමඟ ලංසු ඉදිරිපත් කල යුතුය.

8. ලංසු ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2024.07.19** දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය. ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතිකෂේප කරනු ලැබේ.

9. ලංසුව වලංගු කාලය **2024.06.21** දක්වා පමණක් වේ.

10. සම්පූර්ණ කල ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම් පස කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර **සභාපති, වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව, පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, පුත්තලම් පාර , කුරුණෑගල** යන ලිපිනයන්ට **2024.03.22** දින 14.00 පැය හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින 14.00 පැයට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති ,**
වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව ,
පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
කුරුණෑගල.